ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

21/05/2026 චක්‍රලේඛන අංක 42 /2026

සියළුම දිසා කොමසාරිස් මගින්,
සියළුම සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා)

**<u>සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා) රැස්වීම</u>**
**<u>2026 ජූනි මස 06 දින පෙ.ව 9.00 ට</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ බාලදක්ෂ බාලිකා සහය දිසා කොමසාරිස් වරුන් සඳහා පවත්වනු ලබන රැස්වීම **<u>2026 ජූනි මස 06 දින පෙ.ව 9.00 ට</u>** ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත් වේ.

2026 වර්ෂයේ බාලදක්ෂ බාලිකා අංශයේ ඉදිරි වැඩ කටයුතු සම්බන්ධව ඔබගේ දැනුම යාවත්කාලීන කිරීම මෙහි අරමුණ වන අතර ඒ සඳහා ඔබ දිසාවේ බාලදක්ෂ බාලිකා සහය දිසා කොමසාරිස් වරිය සහභාගී කරවන මෙන් ඉල්ලා සිටිමු.

බාලදක්ෂ බාලිකාවන්ගේ පදක්කම් සමත් කිරීම මෙම වසරේ සිට නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව විෂය මාලාවට එකතු විය යුතු අංග හා නව සංශෝධන පිළිබඳ අධ්‍යනය කර අදහස් ඉදිරිපත් කිරීමට සූදානම්ව පැමිණෙන්න.

එදින රැස්වීම සඳහා සහභාගී වන සියලුම බාලදක්ෂ නායක නායිකාවන් නිල ඇඳුමෙන් පැමිණිය යුතු බවද දන්වා සිටිමු.

බාලදක්ෂ බාලිකා අංශය උසස් මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ඔබ සැමගේ දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

මේ පිළිබඳ ඔබගෙන් ලැබෙන සහය, අගය කොට සලකමු.

**ස්තූතියි,**
**මෙයට,**
**බාලදක්ෂ සේවයේ නියුතු,**

***චන්ද්‍රානි ප්‍රනාන්දු***
සහය ප්‍රධාන කොමසාරිස් (පෝතක/බාලදක්ෂ බාලිකා)

***නීතිඥ. මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

**පිටපත් -**
ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ගරු සභාපති, ගරු විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික කාර්යයාල ලිපි ගොනුවට